**විසර්ජන ශීර්ෂය - 263 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

i. කොට්ඨාශ හා ගම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ කටයුතු සමායෝජනය කිරීම මෙන්ම නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමටත් , එහිදී අදාල ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

ii. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජිතයින් වශයෙන් කටයුතු කරමින් කරනු ලබන ගෙවීම් සහ ආදායම් රැස් කිරීම.

iii. විමධ්‍යගත අයවැය වැඩසටහන හා වෙනත් සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාල ගෙවීම්.

iv. පළාත් සභාවට පැවරී ඇති කාර්යයන් සඳහා අවශ්‍ය විට සහභාගී වීම සහ එහිදී කළයුතු වන ආදායම් රැස් කිරීම සහ ගෙවීම් කටයුතු.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) හම්බන්තොට
(ආ) අම්බලන්තොට
(ඇ) තිස්සමහාරාම
(ඈ) ලුණුගම්වෙහෙර
(ඉ) සූරියවැව
(ඊ) අඟුණකොළපැලැස්ස
(උ) තංගල්ල
(ඌ) බෙලිඅත්ත
(එ) ඕකෙවෙල
(ඒ) වීරකැටිය
(ඔ) වලස්මුල්ල
(ඕ) කටුවන

1.3 විගණන විෂය පථය

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 28 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිලිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 803,799,449 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 736,885,060 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 66,914,389 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 558,180,000 | 665,179,449 | 42,831,423 | 06 |
| මූලධන | 52,850,000 | 138,620,000 | 24,082,966 | 17 |
| එකතුව | 611,030,000 | 803,799,449 | 66,914,389 | |

**(ii) අයවැය විචලනය**

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට 91 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

- ව්‍යාපෘති අංක 01 හි වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය රු. 175,000,000 ක් වී තිබු නමුත් වර්ෂය තුළ මුළු වියදම රු. 25,832,800 ක් එනම් ප්‍රතිපාදනයෙන් සියයට 14.76 ක් පමණක් විය. රු. 118,395,000 ක් එනම් ප්‍රතිපාදනයෙන් සියයට 67.65 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

- වැය විෂයයන් 05 කට අදාලව එකතුව රු. 52,220,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ මාරුකර තිබුණු අතර එයින් එකතුව රු. 43,780,202 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 8,439,798 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම

ඉතිරිය මාරුකරන ලද ප්‍රතිපාදන වලින් සියයට 13.8 සිට සියයට 44.3 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 24 කින් හා දෙපාර්තමේන්තු 18 කින් පිළිවෙලින් රු. 1,352,586,056 ක් හා රු. 948,168,660 ක් වශයෙන් එකතුව රු. 2,300,754,716 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එයින් පිළිවෙලින් රු. 1,239,612,715 ක් හා රු. 947,770,922 ක් වශයෙන් එකතුව රු. 2,187,383,637 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 113,371,079 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

- අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු දෙකක් විසින් සලසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා 2012 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත පරිදි වියදම් දරා තිබුණි.

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට මුළු වියදම | අතිරික්තය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 19,207,048 | 19,262,442 | 55,394 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 5,145,982 | 5,271,518 | 125,536 |

- අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිරිමැටිය උස්සාන ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒකක මිල ගණනය කිරීම සඳහා දිග මීටර් 06 ක් වූ 3" Type 600 P.V.C ජල නලයක මිල රු. 4,500 ක් ලෙස සලකා තිබුණද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ වෙළඳ පොළේ රු. 2,600 ක් පමණ වූ මුදලකට මිලදී ගත හැකි දිග මීටර් 06 ක් වූ නැලෝටා වර්ගයේ 3" Type 600 P.V.C ජල නල ව්‍යාපෘතිය සඳහා යොදාගෙන තිබූ බවය. දිග මීටර් 368 ක් ජලනල එළීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.276,000 ක් 2011 සහ 2012 වර්ෂවල ගෙවා තිබුණද යොදා තිබූ ජලනල වර්ගය අනුව ගෙවිය යුතු මුදල රු. 159,467 කි. ඒ අනුව රු. 116,533 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

- ජාතික සවිය ගම නැගුම 2012 වැඩසටහන යටතේ ගෙවතු සඳහා ජලය සැපයීම වෙනුවෙන් රු. 2,907,808 ක ගිවිසුම්ගත මුදලකට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උස්සාන ජල යෝජනා ක්‍රම 03 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ ආර්පිකෝ වර්ගයේ දිග මීටර් 06 ක් වූ 3" T 600 වර්ගයේ ජලනලයක වෙළඳපල මිල රු. 2,500 ක් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අවස්ථාවේ එම නලයක

වෙළඳපල මිල රු. 2,160 ක් ව තිබියදී ජලනලයක මිල රු. 3,953 ක් ලෙස සලකා ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් රු. 395,865 ක අධි ඇස්තමේන්තුවක් පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

- තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් අළුත්ගොඩ සියඹලාගස්වැවෙන් බස්නා ඇල කණ්ඩිය ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් 2012 වර්ෂයේදී බිල්පත් අනුව බොරළු ඝණ මීටර් 759.35 ක් ඇතිරීම සඳහා රු. 691,768 ක් ගෙවා තිබුණද භෞතික පරික්ෂාවට අනුව ඉටුකළ වැඩවල ප්‍රමාණය ඝණ මීටර් 173.65 කි. ඒ අනුව රු. 533,573 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි.

**(iv) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු වලින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් පුනරාවර්තන හා මුලධන වියදම් වලින් පිළිවෙලින් සියයට 02 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළයුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති අංක 02 වෙනුවෙන් ප්‍රතිපාදන ඉතිරිකර නොතිබුණු අතර ව්‍යාපෘති දෙකටම අදාලව මුළු ඉතිරි කිරීම් ප්‍රතිශතයන් ව්‍යාපෘති අංක 01 න් සිදුකර තිබුණි.

**(v) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය**

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුළත වියදම් කළමනාකරණය කරගත යුතු බවත් , ඒ සඳහා කිසිදු අතිරේක මුදලක් ලබා නොදෙන බවත්, මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්, එම උපදෙස් නොතකා එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු. 2,965,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතිය සහිතව මාරුකර තිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 40,000,000 | 28,081,698 | 26,000,000 | 29,878,323 | 155,000,000 | 134,824,614 |

විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 3,562,205 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 216,970,794 ක් වූ අතර ඒ තුල වර්ෂ දෙකක් ඉක්මවූ රු.8,432,429 ක් වූ තැන්පතු 294 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, 2011 මාර්තු 18 වන දින සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි සකස් කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත (1.6.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.6.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා**

**--------------------------------**

ඉහත (1.6.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402 (1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජුනි 17 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.6.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.6.5 අභ්‍යන්තර විගණනය**

**----------------------**

සමාලෝචිත වර්ෂයතුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**1.6.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

**---------------------------------------------------------**

අංක IAI /2000/1 හා 2009 ජුනි 12 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාර සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2012 වර්ෂය තුළ පවත්වා තිබුණේ කමිටු රැස්වීම් දෙකක් පමණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**---------------------------**

**නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 4 දරන නිල නිවාසය හා අඟුණකොළපැලැස්ස සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය වසරක පමණ කාලයක සිට ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

- 2010 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ කඩිගමුව ප්‍රජාමූල සංවිධානයට ලබාදීම සඳහා 2010 වර්ෂයේදී රු. 74,088 ක් වැයකර මිලදී ගෙන තිබූ ජල මීටර් 27 ක් විගණිත දිනය වූ 2013 පෙබරවාරි 28 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව ගබඩාවේ පැවතුනි.

## 1.8 අනුකූල නොවීම්

### (අ) නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| <u>මුදල් රෙගුලාසි</u> | | |
| මු.රෙ. 685 | 562,060 | 2012 වර්ෂයේ මාස 05 ක කාලයක් තුල වියලි කාලවලදී තණ පිට්ටනි වලට හා සිටුවා ඇති ගස් /පැල වලට බවුසර් මගින් ජලය සැපයීම වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණයක් නොමැතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් සිදුකර තිබුණි. |
| මු.රෙ. 703 (2) | 1,000,000 | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ ඉහලගොඩ හත්බෝධිය වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණද ගිවිසුම් ගත ගොවි සංවිධානය විසින් කොන්ත්‍රාත්තුව ඉටු නොකර බාහිර පුද්ගලයෙකු වෙත උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| | 1,181,999 | ජාතික සවිය 2012 ප්‍රතිපාදන යටතේ සූරියවැව |

| | | |
|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහළ කුඹුක්වැව පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සමෘද්ධි සමිතියකට පවරා තිබුණද අනුමැතියකින් තොරව ගිවිසුම්ගත සමිතිය විසින් බාහිර පුද්ගලයෙකුට උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| | 1,508,890 | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මහ ඉදිවැව වම්ඉවුර ඇල ප්‍රතිසංස්කරණය 1 අදියර කර්මාන්තය ගොවි සංවිධානයකට පවරා තිබුණද එම සංවිධානය විසින් අනුමැතියකින් තොරව වෙනත් පුද්ගලයකුට උපකොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| | 1,237,515 | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ශ්‍රී විජයගම උස්සාන ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකිරීමේ කර්මාන්තය ග්‍රාම සංවර්ධන සමිතියකට පවරා තිබුණු අතර එම සමිතිය විසින් අනුමැතියකින් තොරව වෙනත් පුද්ගලයෙකුට උපකොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| <u>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ</u> 2008 ජුලි 15 දිනැති අංක ගමනැගුම /04/2008 දරන චක්‍රලේඛය | 5,694,209 | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 , 2010 හා 2012 වර්ෂවල සමෘද්ධි බැංකු 05 ක් වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 7,506,000 ක මුදල් ලබාදී තිබු අතර විගණිත දිනය වූ 2012 නොවැම්බර් 30 දින වන විට සමෘද්ධි බැංකුවල නිෂ්ක්‍රීයව මුදල් ශේෂ පැවතුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

වයාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| දංකැටිය දහම්පල අතුරු මාර්ගය හා තිස්සපාර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 1,050,838 | 2012 සැප්තැම්බර් | මාර්ගය අයත් ඉඩමක් සඳහා නඩුවක් පැවතීම. |

(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණද, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු-ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| රණසිරිපුර සාමබෝධි රාජ විහාරස්ථානයේ සංවර්ධන කටයුතු | 50,000 | 2012.10.20 | - | දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව වැඩ කටයුතු ඉටු නොකිරීම. |
| පහල මත්තල ශ්‍රී ජයබෝධි විහාරස්ථානයේ වැඩ නිමකිරීම | 50,000 | 2012.10.10 | - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| සාලියපුර බෙරලිහෙල ආරම්භ කිරීමට නියමිත දේශීය සම්භාණ්ඩ නිෂ්පාදනාගාරයේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 475,000 | 2012.12.06 | 7,280 | - එම - |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**
---------------------------------

වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇස්තමේන්තු වටිනාකම රු. 1,052,504 ක් වූ වී වපුලවල සිට ගම්මායිම දක්වා මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ගොවි සංවිධානයකට පවරා තිබුණ අතර 2012 ඔක්තෝබර් 22 දින එම ගොවි සංවිධානය සමඟ රු. 997,510 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණි. විගණිත දිනය වූ 2013 මැයි 15 දින වන විට කොන්ත්‍රාත්කාර ගොවි සංවිධානයට රු. 335,939 ක මුදලක් ගෙවා තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව මාස 02 ක් ඇතුළත කොන්ත්‍රාත් කටයුතු අවසන් කර ප්‍රාදේශීය ලේකම් වෙත භාරදිය යුතුවේ. කෙසේ වුවද කර්මාන්තය අවිච්ඡේද කර තිබූ අතර විගණන දිනය වූ 2013 මැයි 15 දින වන විටත් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර භාරදී නොතිබුණි.

**1.10. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**
----------------------------------------

**(අ) අක්‍රීය බැංකු ගිණුම්**
---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුම් 02 ක් 2012 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව තිබුණු අතර ඒ ඒ ගිණුමට අදාලව අක්‍රීයව තිබුණු කාලය සහ අක්‍රීයව පැවැති ශේෂය පහත දැක්වේ.

| බැංකු ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව තිබුණු කාලපරිච්ඡේදය | අක්‍රීයව පැවැති ශේෂය |
|---|---|---|
| | | රු. |
| 324 | අවුරුදු 19 | 23,470 |
| 01 | අවුරුදු 27 | 1,011 |

**(ආ) ගැලපුම් කලයුතු ශේෂ**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වු තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 6ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවු තැන්පතු | - | 400 | 6,470 | 6,870 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 12,044 | 38,027 | - | 50,071 |

**1.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වු අවස්ථාවක් පහත දැක්වේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 සඳහා Lap Top පරිඝණක 13 ක් එකක් රු. 103,200 ක් බැගින් රු. 1,341,600 ක් ගෙවා 2012 වර්ෂයේදී මිලදීගෙන තිබුණි. භාණ්ඩ භාරදී තිබු ලේඛනයට අනුව ඉන්වොයිසියේ සඳහන් නොවු අනුක්‍රමික අංකයන් සහිත Lap Top පරිඝණක 04 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් වෙත ලබාදී තිබුණි.

**1.12 අවිධිමත් ගනුදෙනු**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වු එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්**

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුව ප්‍රාදේශීය මිල කමිටුවට වෙළඳපල මිල සැදහුම් මගින් මිලදීගත හැකි සීමාව රු. 500,000 ක් වුවද එම ප්‍රමාණය ඉක්මවා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතෘ සායන මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීමට රු. 886,652 ක් වටිනා උපකරණ 2011 දෙසැම්බර් 19 දිනැති අංක 34 දරන ප්‍රසම්පාදන තීරණය මත මිලදී ගෙන තිබුණි.

(ආ) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතෘ සායන මධ්‍යස්ථාන වෙත ලබාදීම සඳහා 2011 වර්ෂයේදී භාණ්ඩ මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශයක්ද ලබා නොගෙන අඩු මිල ගණන් වෙනුවට වැඩි මිලගණන් යටතේ භාණ්ඩ මිලදී ගැනීම නිසා රු. 245,377 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික සවිය ගම නැගුම වැඩසටහන 2011 යටතේ මැදමුලන සෞඛ්‍ය මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ඉටුකිරීම වෙනුවෙන් විගණිත දිනය වූ 2013 මැයි 15 දින වන විට කොන්ත්‍රාත්කරුවන් සඳහා රු. 3,074,075 ක මුදලක් ගෙවා තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. 3,296,503 ක් වූ ඉහත කර්මාන්තය ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය සහ 2006 භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු නොකර , එක් කොන්ත්‍රාත්තුවක් ලෙස කරගෙන යායුතු වැඩ කොටස් කොන්ත්‍රාත් දෙකකට වෙන්කර සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ අනුමත සමිති දෙකක් වෙත එකම දිනකදී කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

**1.13 අනාර්ථික ගනුදෙනු**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2006/2007 වර්ෂවල විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රැකියා විරහිත තරුණ තරුණියන් 46 දෙනෙකුට රියදුරු පුහුණුව ලබාදීම සඳහා ගෙවා තිබූ රු. 300,000 ක මුදලින් 2013 මාර්තු 28 දින වන විටත් පුහුණුව අවසන් කර තිබුණේ තරුණ තරුණියින් 33 දෙනෙකු පමණි. පුහුණු නොකළ තරුණ තරුණියන් 13 දෙනා වෙනුවෙන්

ගෙවන ලද රු. 92,250 ක මුදල සඳහා වෙනත් පුද්ගලයින් යොමු කිරීමට හෝ එම මුදල නැවත අයකර ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ආ) ලූණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2006 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රැකියා විරහිත තරුණ තරුණියන් 42 දෙනෙකු වෙත රියදුරු පුහුණුව ලබාදීම සඳහා 2006 අගෝස්තු 31 දින රු. 236,250 ක් තංගල්ල ඩිපෝව වෙත යවා තිබුණි. එහෙත් 2013 මාර්තු 28 දින දක්වාත් තරුණ තරුණියන් 23 දෙනෙකු වෙත පුහුණුව ලබාදීමට කටයුතු නොකිරීම නිසා ඒ වෙනුවෙන් ගෙවන ලද රු. 129,375 ක මුදල නිෂ්කාර්ය ගෙවීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ලූණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ 2011 දෙසැම්බර් 31 දින රැකියා විරහිත තරුණ තරුණියන් 13 දෙනෙකුට රියදුරු පුහුණුව ලබාදීම සඳහා මිරිජ්ජවිල වෘත්තීය පුහුණු අධිකාරිය වෙත රු. 125,000 ක මුදලක් ගෙවා තිබුණ අතර 2013 මාර්තු 28 දින වන විටත් ප්‍රතිලාභීන් 06 දෙනෙකු වෙත රියදුරු පුහුණුව ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2005, 2006, 2007 හා 2008 වර්ෂවල විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ රැකියා විරහිත තරුණ තරුණියන් 107 දෙනෙකු වෙනුවෙන් රු. 678,475 ක මුදලක් සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තංගල්ල රුහුණු බස් සමාගම වෙත ගෙවා තිබුණද විගණිත දිනය වූ 2012 ඔක්තෝබර් 19 දින වන විටත් පුහුණුව අවසන් කර තිබුණේ 20 දෙනෙකු පමණි. ඉතිරි ප්‍රතිලාභීන් 87 දෙනා වෙනුවෙන් ගෙවා තිබූ රු. 567,750 ක මුදල වෙනුවෙන් නැවත ප්‍රතිලාභීන් යොමු කර ඔවුන් පුහුණුව නිමකල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

**1.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 37 | 07 | - |
| ii. තෘතියික මට්ටම | 33 | 16 | 17 | - |

| | | | | |
|---|---|---|---|---|
| iii. ද්විතියික මට්ටම | 967 | 769 | 199 | 01 |
| iv. ප්‍රාථමික මට්ටම | 117 | 109 | 10 | 02 |
| v. වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 07 | 01 | 03 |
| | ------ | ----- | ----- | ---- |
| එකතුව | 1166 | 938 | 234 | 06 |
| | ==== | === | === | == |